ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 දෙසැම්බර් මස 09 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 දෙසැම්බර්

2013 වසර මුළුල්ලේම ක්‍රියාත්මක කළ මුදල් ප්‍රතිපත්ති තීරණවල කාලෝචිත සහ යෝග්‍ය බව පිළිබිඹු කරමින් පසුගිය මාසය තුළදී සැලකියයුතු ධනාත්මක සාර්ව ආර්ථික ප්‍රවණතාවන් රැසක් වාර්තා විය.

2013 තෙවන කාර්තුවේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය විය. උද්ධමනය අපේක්ෂා කළ මට්ටමටත් වඩා සැලකියයුතු ලෙස පහත වැටුණු අතර, විදේශීය අංශය තවදුරටත් වැඩිදියුණු විය. පෞද්ගලික ආයෝජන සඳහා මූල්‍ය සම්පත් ප්‍රවාහ වැඩි කිරීමට පහසුකම් සලසමින්, ප්‍රධාන රාජ්‍ය සංස්ථාවන්හි මූල්‍ය තත්ත්වය යහපත් අතට පත්වීම නිසා මෙම ආයතන විසින් බැංකු අංශයට සිදු කළ ණය ආපසු ගෙවීම් සැලකිය යුතු ලෙස වැඩි විය. 2013 ඔක්තෝබර් මාසයේදී බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. මෙවැනි සාධක ඉදිරි ආර්ථික වර්ධන වේගය සඳහා හිතකර සලකුණු වන අතර, දිගුකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික පහත බැසීම අඛණ්ඩවම සිදුවීම තුළින් වෙළෙඳපොළ විශ්වාසනීයත්වය සහ හිතකර ආයෝජන අභිප්‍රායයන් වඩාත් සවිමත් කරනු ඇත.

2013 වසරේ තෙවන කාර්තුවේදී, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සියයට 7.8 කින් වර්ධනය වීම සඳහා ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශයන් ධනාත්මකව දායක විය. කෘෂිකාර්මික අංශය දෙවන කාර්තුවේ දී පෙන්නුම් කරන ලද පසුබෑමෙන් නැවත යථාතත්ත්වයට පත් වෙමින් තෙවන කාර්තුවේ දී සියයට 7.0 කින් වර්ධනය විය. කාර්මික අංශය පළමු කාර්තු දෙක තුළ දී පෙන්නුම් කළ ඉහළ වර්ධන වේගයට අනතුරුව තෙවන කාර්තුවේ දී සියයට 8.1 කින් වර්ධනය වූ අතර, සේවා අංශය පෙර කාර්තුවේ වාර්තා කළ සියයට 6.6 ක සිට තෙවන කාර්තුවේ දී සියයට 7.9 කින් වර්ධනය විය. තෙවන කාර්තුවේ ඇති වූ හිතකර, පුළුල් පදනමකින් යුත් ආර්ථික වර්ධන ක්‍රියාකාරීත්වය, වසර තුළදී සියයට 7.0 ඉක්ම වූ ආර්ථික වර්ධනයක් සඳහා වූ අපේක්ෂාවන් සවිමත් කරයි.

ආහාර සහ ආහාර නොවන අයිතමයන්ගේ මිල ගණන් ඉහළ යාමේ වේගය අඩුවීම ප්‍රධාන වශයෙන්ම හේතුකොටගෙන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, මතුපිට උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 6.7 ක සිට 2013 නොවැම්බර් මාසයේ දී සියයට 5.6 දක්වා අඩු විය. මේ අතර මූලික උද්ධමනය තවදුරටත් අඩු වූ අතර 2013 නොවැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එහි අවම අගය වූ සියයට 2.4 ක් විය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද පෙර මාසයේ පැවති සියයට 7.6 සිට නොවැම්බර් මාසයේ දී සියයට 7.3 දක්වා අඩු විය. ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන් අඩුවීම, දේශීය සැපයුම් අංශයේ වර්ධනයන් සහ ඉල්ලුමින් ඇදුණු උද්ධමනාත්මක පීඩන මනාව පාලනය වීම හේතුකොටගෙන උද්ධමන අපේක්ෂාවන් තවදුරටත් හිතකර මට්ටමක පවතියි. මෙම පසුබිම තුළ, වර්තමාන පුරෝකථනයන්ට අනුව, උද්ධමනය 2014 වසර මුළුල්ලේ ද මැදි තනි අංකයක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

භාණ්ඩ අපනයන ඉපැයුම් සැලකියයුතු ලෙස ඉහළ යාමත් සමඟ, ආනයන වියදම් මන්දගාමී වීම හමුවේ වෙළෙඳ හිඟය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස 2013 ඔක්තෝබර් මාසයේ විදේශීය අංශයේ දර්ශකයන් යහපත් විය. අපනයන ඉපැයුම් එහි වාර්තා වූ ඉහළම මාසික අගය වාර්තා කරමින් 2013 ඔක්තෝබර් මාසයේ දී සියයට 35.1 කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම) වර්ධනය වී ඇ.එ.ජ. ඩොලර් මිලියන 1,041 ක අගයට ළඟා විය. අපනයන වර්ධනය දියුණු ආර්ථිකයන් යථාතත්ත්වයට පත්වීම පිළිබඳ අපේක්ෂා ඉහළ නැංවූ අතර වසරේ ඉතිරි කාලසීමාව තුළ දී සහ 2014 වසරේ දී ද අපනයන ආදායම්හි වර්ධන අපේක්ෂාවන් ඉහළ නැංවීය. 2013 මුල් මාස දහය තුළ දී ආනයන වියදම්වල සමුච්චිත අගය සියයට 1.1 කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගිය අතර, ඔක්තෝබර් මාසය තුළදී සියයට 2.8 කින් පහළ ගියේය. මේ අතර, විදේශීය වෙළෙඳාම් කටයුතුවල ඇති වූ ප්‍රගතිය, ඉහළ ගිය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක අංශයේ ඉපැයීම්, මූල්‍ය අංශය වෙත වූ ලැබීම් ඉහළ යාම සහ වෙළෙඳපොළ අපේක්ෂාවන් ශක්තිමත් වීම හේතුකොටගෙන නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය තුළ, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තවදුරටත් ස්ථාවර මට්ටමේ පැවතුණි.

නිරපේක්ෂ අගය අනුව, 2013 ඔක්තෝබර් මාසයේදී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය රුපියල් බිලියන 27.2 කින් වර්ධනය විය. පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යාම සලකුණු කරමින් 2013 සැප්තැම්බර් මාසයේ දී පැවති මට්ටමට සමානවම, වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකකවලින් ලබාදුන් ණය මෙම මාසය තුළ දී සමස්ත ණය ප්‍රමාණයෙහි නිරපේක්ෂ වර්ධනයට රුපියල් බිලියන 20.1 කින් පමණ දායකත්වයක් දැක්වීය. 2013 ඔක්තෝබර් මාසය තුළදී රුපියල් බිලියන 12.5 ක ණය ආපසු ගෙවීමත් සමඟ රාජ්‍ය සංස්ථා වෙත ලබා දුන් ණය අනුගාමී දෙවන මාසයටත් අඩු විය. මේ අතර, මෙම මාසය තුළ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යාම මෙන්ම බැංකු අංශයෙහි ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස වැඩිවීම සහ රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ යාම හේතුකොටගෙන පුළුල් මුදල් සැපයුම (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) සියයට 18.3 කින් වර්ධනය විය. 2014 වසර සඳහා වන ජාතික අයවැයෙන් ඉදිරිපත් කළ පරිදි, බැංකු ණය ගැනීම් සඳහා වන සංශෝධිත පුරෝකථන අනුව රජය වෙත ලබා දුන් ශුද්ධ ණය අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය සංස්ථාවන්හි අපේක්ෂිත වර්ධනයන් අඛණ්ඩවම සිදු වීම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව හේතුකොටගෙන ඉදිරි කාලසීමාවේදී මුදල් ප්‍රසාරණය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2013 දෙසැම්බර් මස 6 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී, දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සුදුසු යැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 6.50 සහ සියයට 8.50 ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. 2014 වසරේ දී මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම පිළිබඳ පුළුල් මඟපෙන්වීමක් සහිතව 2014 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති පෙරදැක්ම 2014 ජනවාරි 02 වැනි දින ප්‍රකාශයට පත්කිරීමට අපේක්ෂා කෙරේ.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.